තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

**එම්. ජී සුමනදාස එ. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම/277/2018 (2018.07.17 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
කොමිෂන් සභා සාමාජික: විනිසුරු රෝහිණී වල්ගම
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - එම්. ජී. සුමනදාස **මහතා**
**නොතිසි ලත් පාර්ශවය - ලේකම්,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

**පෙනීසිටීම**
අභියාචක - එම්. ජී. සුමනදාස **මහතා**
පොදු අධිකාරිය - එල්. ජී. එන්. ඩී. සෝමපාල, සහකාර ලේකම්
ටෙක්ලා පී. කුමාරගේ, පරිපාලන නිලධාරී
එච්. ඩී. පී. චතුරිකා, කළමනාකාර සහකාර

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.01.15, 2018.02.08 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.02.24 (අභියාචනය ලැබුණු බව දැන්වීම)<br>2018.01.25 (පිළිතුර) |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.02.08 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.03.22 (තොරතුරු නිලධරයාගේ දෙවැනි ප්‍රතිචාරය) |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.03.20 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක විසින් 2018.01.15 හා 2018.02.08 දිනැති තොරතුරු ඉල්ලීම මගින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි විධිවිධානයන්ට අනුකූලව විධායක සේවා සණයේ තොරතුරු ඉල්ලා සිටින ලදී:
මෙයට ප්‍රතිචාර ලෙස තොරතුරු නිලධාරියා විසින් 2018.02.12 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා ගුරු සේවයේ සිට ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වීම් ලැබූ නිලධාරීන්ගේ වැටුප් සැකසීම යනුවෙන් ශිර්ෂගත ලිපියක් සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තියේ විදුහල්පතිවරුන්ගේ වැටුප් ගෙවීම සම්බන්ධව යනුවෙන් ශිර්ශගත ලිපියක් අභියාචකට ලබා දෙන ලදී. මෙයින් අතෘප්තියට පත් අභියවක විසින් නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කොට නැති අතර, 2018.03.29 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සළකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියේ සන්තකයේ, භාරයේ හෝ පාලනයේ පවතී තොරතුරු වූ බැවින් සහ පනතේ 5 වැනි වගන්තියේ සඳහන් ව්‍යතිරේඛයනටද යටත් නොවන බැවින්, පොදු අධිකාරිය විසින් අභියාචක වෙත ලබා දී ඇත.

**නියෝගය:**

අභියාචක විසින් ඉල්ලුම් කරන ලද තොරතුරු පොදු අධිකාරිය විසින් ලබා දී ඇති බැවින් අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කිරීමට නියෝග කර සිටිමු.
****